Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 08 - 2024**

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ ..............................................................................................................

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

- අංක 1 සහ 2 යන ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1) වංචනිකයන් හසුකර ගැනීමට නීතිය ක්‍රියාත්මක වීම ඇතැම් විට <u>කුනිස්සන්ට දැල් දැමීමකි.</u>
   1. ප්‍රයෝජනවත් ක්‍රියාවකි
   2. නිශ්ඵල ක්‍රියාවකි
   3. නිරතුරුව සිදුවන ක්‍රියාවකි.
   4. කලාතුරකින් සිදුවන ක්‍රියාවකි.

2) මුළු ගම ම බය කරගෙන සිටි සියාතු ගේ <u>පොරකටු ගෙවිලා</u> යැයි සීයා නිතරම පැවසුවේ ය.
   1. බලය පිරිහීම
   2. ශරීර ශක්තිය නැති වී යාම
   3. සියලු ධනය අහිමි වීම
   4. ආබාධිතයෙකු බවට පත් වීම

- අංක 03 සහ 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාස සහිත පද පමණක් අඩංගු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

3) 1. කළමනාකරණය, තීක්ෂණ, ගනකාධිකාරී
   2. සොරමුළ, ළමා කැළ, භික්ෂුව,
   3. නිෂ්පාදනය, කණ්ඩායම, ඡන්දය
   4. සඳකිරණ, සඳකඩපහන, ලඳුන්ගේ රැඟුම්

4) 1. බුදුගුන, පුස්ථකාලය, අරමුණ
   2. ලේඛම්, වදාළේය, ප්‍රනීත
   3. ප්‍රතිඵලය, මධ්‍යස්ථානය, දියුණුව
   4. නවීකරණය, ශ්‍රමණ, හදාල

5) අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.
   1. පරාස්ස, මනමේ, විකෘති, කදාවළලු
   2. බැද්දේගම, මනුතාපය, කලියුගය, යුගාන්තය
   3. තාගෝර්, වික්‍රමසිංහ, මහගමසේකර, ජයතිලක
   4. ගාල්ල, තංගල්ල, පාදුක්ක, රත්නපුර

- අංක 6 සහ 7 ප්‍රශ්නවල සුදුසු ආඛ්‍යාත පදය තෝරා යටින් ඉරක් අඳින්න.

6) (අ) ගෙවිලිය ඇඹුල රැගෙන කුඹුරට ................................ (ගියේය/ගියාය)

   (ආ) ශිෂ්‍යයෝ ගීයක් ගායනා ................................ (කළෝය/කළේය)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

7) (අ) සියලු සත්ත්වයෝ සුවපත් ................................. (වෙත්වා / වේවා)
(ආ) මඟුල් ඇතු පෙරහැරේ පස් දිනක් වීදි සංචාරය ........................... (කළේය/ කළෝය)

- **අංක 8 හා 9 ප්‍රශ්නවල නිවැරදි ක්‍රියාපද වර්ගය දක්වා ඇති පිළිතුර තෝරන්න.**

8) කතාව <u>පවත්වමින්</u> සිටි කථිකයා හදිසියේ වේදිකාව මත ඇද වැටුණි.
1. පූර්ව ක්‍රියා පදයකි.
2. විධික්‍රියා පදයකි
3. අවසාන ක්‍රියා පදයකි.
4. මිශ්‍ර ක්‍රියා පදයකි.

9) වරෙව් යමව් <u>නැගිටිවු</u> නොපියව් දෙඇස
1. විධි ක්‍රියා පදයකි
2. පූර්ව ක්‍රියා පදයකි
3. මිශ්‍ර ක්‍රියා පදයකි
4. අවසාන ක්‍රියා පදයකි.

- **අංක 10 හා 11 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

10) තාත්තා මිරිස් ...........................(පැළ/පැල) වලට වතුර වත්කළේය.

11) වෛද්‍ය උපදේශයකින් තොරව .....................(කණට/කනට) බෙහෙත් නොදැමිය යුතුයි.

- **අංක 12, 13 සහ 14 ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

12) සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජන අකුරු ගණන හා ස්වර අකුරු ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
1. 25ක් හා 20ක්
2. 42ක් හා 18ක්
3. 60ක් හා 18
4. 42ක් හා 10

13) මහා ප්‍රාණ අක්ෂරයක් නොයෙදුණු වචනයක් සහිත පිළිතුර වන්නේ,
1. ග්‍රන්ථය, කෘත්‍යය, භාෂාව, ආභරණ
2. ධනය, ආඛ්‍යාතය, ඡත්‍රය, ප්‍රතිඵල
3. භාජනය, බාධාව, අපේක්ෂාව, සාර්ථක
4. බෝධිය, සාධාරණ, ප්‍රාර්ථනය, සජ්ඣායනය

14) එස් මහින්ද හිමියන් විසින් රචනාවූ නිර්මාණයක් නොවන්නේ,
1. නිදහසේ දැහැන
2. ලංකා මාතා
3. දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල
4. අවුරුදු සිහිනය

- **15 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර හිස්තැන මත ලියන්න.**

15) "බැද්දේ ගියා වැලක් සොයා ගන්ට කියා ඉද්ද වැල් තිබෙන්නා පෝට වැල් තිබෙන්නා නොයෙක් වැල් තිබෙන් නා එයින් එකක් ගෙනල්ලා වෙළුවා සේ ම
වෙළි වෙළි වෙළී ඉස සිට දෙපතුලට වෙළී"
මෙම ජනකවිය අයත් ජනකවි වර්ගය වන්නේ,.......................................................................

16) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.
1. බළලුන් ලවා ................................................බාවන්නා වගෙයි.
2. වක්කඩේ ..........................................හැංගුවා වගේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

17) පහත සඳහන් බහ්වර්ථ පදවලින් අර්ථවත් වන පද දෙක බැගින් ලියන්න.

1. වත ............................................ ..........................................
2. දද ............................................ ..........................................

18) පහත පද සඳහා විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

1. අනුලෝම .......................................................
2. ප්‍රවීණ .......................................................

19) පහත පද සඳහා සමානාර්ථ පද දෙක බැගින් ලියන්න.

1. අහස ............................................ ......................................
2. නුවණ ............................................ ......................................

20) පහත යෙදුම් සඳහා තනි පද ලියන්න.

1. අනුන්ගේ යහපත සඳහා ක්‍රියාකරන ....................................................
2. තුන් පැත්තකින් මුහුදින් වටවූ ....................................................

(ලකුණු 1 × 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II - කොටස

- **1, 2, හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

1) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
   i. අවුරුදු සිහිනය කෙටි කතාව උපුටා ගත් කෙටිකතා සංග්‍රහය හා එහි රචකයාගේ නම ලියන්න.
   ii. 'සැබෑ ළෙන්ගතුකම' ලියූ කතුවරයා වන හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් විසින් ලියන ලද වෙනත් නිර්මාණ දෙකක නම් ලියන්න.
   iii. කතරගම දෙවියන් සඳහා යෙදෙන තවත් නමක් හා කතරගම දේවාලයේ පැවැත්වෙන උත්සවයක් නම් කරන්න.
   iv. පහත තේරවිලි කවියට ගැළපෙන පිළිතුර ලියන්න.

   පොත්ත උඩින් සුදු පාටට      දිලෙන්නේ
   ඇන්න විට දි සරබර හඬ      නගන්නේ
   ඒ ඇතුළේ පිරිපුන් සඳ      දිලෙන්නේ
   නැට්ට නැති ගෙඩිය තෝරා      එවන්නේ ................................

   v. පහත පදවල අර්ථය ලියන්න.
      I. ගෙරි සියයක්
      II. පාද පරිචාරිකා

(ලකුණු 2 × 5 = 10)

2) පහත මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200ට නොඅඩු රචනාවක් ලියන්න.
   i. පරිසරය ජීවිතය මෙන් සුරකිමු
   ii. ජාතික සමගිය සුරකිමු
   iii. මුහුදු වෙරළේ ගත කළ සැන්දෑවක්
   iv. සුන්දර සිරි ලංකා මගේ රටයි.
   v. "මා කණ්ඩායමෙන් මග හැරී ඇති බව වැටහුණි. මට මහත් බියක් දැනුණි. වටපිටාවේ ඇත්තේ මහා ගස් පමණි. ඉඳහිට වනය තුළින් සර සර හඬ ඇසෙයි .........................." මෙම සිදුවීම ඇසුරින් රසවත් කතාවක් ගොඩ නගන්න.

(ලකුණු 20)

3) ඔබ ඔබේ පාසලේ පරිසර නියමු හට කණ්ඩායමේ කැඳවුම්කරු යැයි සිතා පාසලේ ඩෙංගු උවදුර මැඩලීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් නිර්මාණය කරන්න.

(ලකුණු 10)

4) ඔබේ පෙළපොතේ ඇතුළත් පහත උද්ධෘත ඇසුරින් විමසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. "යන්න පුතා මන් අවුරුද්දට උඹ එක්ක එන්න එනවා."
      (අ) මෙම ප්‍රකාශය කළේ කවුද?
      (ආ) මෙම ප්‍රකාශය කළේ කවර අවස්ථාවක දී ද?
   ii. "මම දැක්කා අධිරාජයාගේ ඇස්වලට කඳුළු උනනවා. එය මා ලද උසස් ම ත්‍යාගය යි."
      (අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුද?
      (ආ) මෙම ප්‍රකාශය කරන්නේ කා හට ද?
   iii. "මාගේ මේ විජිතයට අවසර නැති ව ඇතුළු වූ තා කවුද?"
      (අ) මෙම ප්‍රකාශය ඇතුළත් නාට්‍යය කුමක් ද?
      (ආ) මෙම ප්‍රකාශය කරන්නේ කා විසින් ද?
   iv. "මේ ලිතේ වැදගත් දේවල් ගොඩක් තියෙනවා පුතේ"
      (අ) මෙම කොටස ඇතුළත් පාඩම කුමක් ද?
      (ආ) මෙම ප්‍රකාශය කරන ලද අවස්ථාව කුමක් ද?
   v. "මේකෙ හැඩේ දිගටියටත් තියෙනවා රවුමටත් තියෙනවා."
      (අ) මෙය පවසන්නේ කවුද?
      (ආ) මෙය ශ්‍රවණය කරන (අසා සිටින) අය කවුද?

(ලකුණු 2 × 5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

5) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට ගැළපෙන උක්ත පදය හෝ ආඛ්‍යාත පදය යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

i. ................................ පැසුණු ගොයම් කපති.

ii. ................................ දිවා ආහාරය සකස් කරයි.

iii. මිනිස්සු වෙහෙස නොබලා වැඩ ....................................

iv. කම්කරුවෝ පෙර දින පාරේ වැඩ අවසන් ......................................

v. අම්මා හෙට දළදා මාලිගාවට ................................

vi ගුරුතුමා ඊයේ අපට දඬුවම් ..............................................

vii. පසුගිය දා අපේ ක්‍රීඩක ක්‍රීඩිකවෝ පැරිස් නුවර බලා ......................................

viii වෙළෙන්දෝ කෑ ගසමින් පොළේ බඩු ................................

ix. වේදිකාව මත ශිෂ්‍යාවෝ මනහර නැටුමක් ....................................

x. .................................. වෙල්යායේ සරුංගල් යවති.

(ලකුණු 1 × 10 = 10)

6) පහත ඡේදය කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

හස්ත කඩදාසි කර්මාන්තයට වැඩි වශයෙන් භාවිත කරන අමුද්‍රව්‍ය වන්නේ අලි වසුරුයි. අලියෙකු ආහාරයට ගන්නා ශාක පත්‍රවල තන්තුමය කොටස් වැඩි නිසා ඒවා කඩදාසි නිෂ්පාදනයට වඩාත් යෝග්‍ය වේ. කර්මාන්තයට අවශ්‍ය අලි වසුරු ලබා ගැනෙන්නේ පින්නවල අලි අනාථාගාරයෙනි. හොඳින් වැඩුණු අලියෙකුගෙන් දිනකට සාමාන්‍යයෙන් අලි වසුරු කිලෝග්රෑම් 180 - 200 දක්වා ප්‍රමාණයක් ලබා ගත හැකි බැවින් මෙම කර්මාන්තය ආශ්‍රිතව අමුද්‍රව්‍ය ලබා ගැනීමේ ගැටලු පැන නොනගී.

කර්මාන්තය අන්තර්ජාතික වශයෙන් ව්‍යාප්ත කිරීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ද ලැබී ඇත. එමනිසා ම මෙම හස්ත කඩදාසි නිෂ්පාදනයේ වැදගත් ලක්ෂණයක් වන්නේ, පරිසර හිතකාමී කර්මාන්තයක් වශයෙන් අගය කළ හැකි වීමයි.

i. හස්ත කඩදාසි කර්මාන්තය සඳහා බහුල ව භාවිත කරන අමුද්‍රව්‍යය කුමක් ද?

ii. එම අමුද්‍රව්‍ය වඩාත් යෝග්‍ය වීමට හේතුව කුමක් ද?

iii. එම කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීම ගැටලුවක් නොවන්නේ කුමක් නිසා ද?

iv. මෙම නිෂ්පාදන විදේශ වෙළඳ පොළවෙත යොමු කිරීමට මූලිකත්වය ගත්තේ කවර ආයතනය ද?

v. මෙම ඡේදයේ සඳහන් පරිදි හස්ත කඩදාසි නිෂ්පාදනයේ අගය කළයුතු ලක්ෂණය කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024
Second Term Test - Grade 08 - 2024

සිංහල භාෂාව හා සාහිත්‍යය

පිළිතුරු පත්‍රය

## I - කොටස

1) 2
2) 1
3) 3
4) 3
5) 4
6) 1. ගියා ය 2. කළෝය
7) 1. වෙත්වා 2. කළේය
8) 4
9) 1
10) පැළ
11) කනට
12) 2
13) 3
14) 4
15) ටීකා සීපද
16) 1. කොස්ඇට 2. හකුරු
17) 1. මුහුණ, කතාව, වස්ත්‍රය, සිරිත, තොරතුරු, වස්තුව
    2. කොඩි, කුරුල්ලා, කුෂ්ටය, බමුණා, මෝඩයා
18) 1. ප්‍රතිලෝම 2. ආධුනික
19) 1. අඹර, ආකාශය, ගගන, නුඹ, සුරමග, පවන්මග
    2. නැණ, ඥානය, ඤාණය, බුද්ධිය
20) 1. පරාර්ථකාමී 2. අර්ධද්වීපය

---

## II - කොටස

1) i. රතු රෝස මල ගුණදාස අමරසේකර
   ii. පුංචි දිය කිඳුරිය, අවලස්සන තාරාවා, හිම රැජින
   iii. ශරවනභව, කඳ කුමරු, බරනෙත, මහා සේන
   iv. බිත්තරය
   v. I. ගවයින් සියයක්/හරක් සීයක්
      II. භාර්යාව/බිරිඳ වැනි සමාන පදයක්

(ලකුණු 2 × 5 = 10)

2) i. රචනාවේ

- කරුණුවල සාරවත් බව
- සංවිධානාත්මක බව
- නිර්මාණාත්මක බව
- ප්‍රමාණාත්මක බව
- ප්‍රබල ආරම්භය හා අවසානය
- ශිල්පීය දක්ෂතා (ව්‍යාකරණ, අක්ෂරවින්‍යාස, විරාමලකුණු, පද බෙදීම) ආදිය පිළිබඳ සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

3) දැන්වීම් පත්‍රිකාවේ,

- ආකෘතියේ නිවැරදි බව
- නිර්මාණාත්මක බව
- කරුණුවල ප්‍රශස්ත බව
- සමස්ත නිමාව
- ශිල්පීය දක්ෂතා ආදිය පිළිබඳ සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 10)

4) i. (අ) පියසේනගේ අම්මා
(ආ) ගෙදරින් පිටවීමට සූදානම් වූඅ වස්ථාවේ
ii. (අ) පුංචි කිරිල්ලිය/නයිටිංගේල්
(ආ) අධිරාජයාට
iii. (අ) මනමේ
(ආ) වැදිරජ
iv. (අ) අලුත් අවුරුදු උත්සවය
(ආ) සීයා ලිත බලමින් සිටින විට
v. (අ) සාස්තරකාරයා
(ආ) එතනහාමි සහ ඩිංගිරාල

(ලකුණු 2 × 5 = 10)

5) i. මිනිස්සු/ගොවියෝ වැනි බහුවචන උක්ත නාමපදයක්
ii. අම්මා වැනි ප්‍රථම පුරුෂ ඒකවචන නාමපදයක්
iii. කරති
iv. කළෝය
v. යන්නීය
vi කළේය
vii. පිටත්වූහ/ගියහ
viii විකුණති
ix. නටති/ඉදිරිපත් කරති
x. ළමයි/ළමෝ වැනි ප්‍රථම පුරුෂ බහු වචන නාමපදයක්

(ලකුණු 1 × 10 = 10)

6) i. අලිවසුරු
ii. අලියෙක් ආහාරයට ගන්නා ශාක පත්‍රවල තන්තුමය කොටස් වැඩි නිසා
iii. දිනකට අලියෙකුගෙන් වසුරු කි.ග්.180 - 200 පමණ ලබා ගත හැකි වීම
iv. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
v. පරිසර හිතකාමි කර්මාන්තයක් වීම.

(ලකුණු 2 × 5 = 1)